**කොළඹ විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව**

**නීති පීඨය**

**නීතිවේදී උපාධි පරීක්ෂණය**

**තෙවන වසර (මාර්ගගත ) 2021**

# පරිපාලන නීතිය

(පැය තුනයි)

මුළු ප්‍රශ්න සංඛ්‍යාව **06**

ප්‍රශ්න **<u>තුනකට පමණක්</u>** පිළිතුරු සපයන්න.

(අපැහැදිලි අත් අකුරු සඳහා ලකුණු අඩු කරනු ලැබේ.

---

1. "විසිවන සියවසේ අවසන් වසර පනහ පරිපාලන නීතියේ අසමසම අධිකරණ නිර්මාණශීලීත්වයේ කාල පරිච්ඡේදයකි. අධිකරණ විමර්ශනයේ පදනම් සැලකිය යුතු ලෙස පුළුල් කරන ලද අතර අධිකරණ විමර්ශනයට යටත් වන ආයතන පරාසය පුළුල් විය. අධිකරණ විමර්ශනයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාමය පදනම පිළිබඳ විවාදයේ වැදගත්කම මකා දමා ඇත. සාධාරණභාවය(fairness), යහපත් පරිපාලනය (good administration), සාධාරණත්වය(equity) සහ සමානාත්මතාවය(equality) යන සංකල්ප ලිඛිත හා අලිඛිත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා දෙකෙහිම මූලික වටිනාකම් ලෙස පවතී."

   පරිපාලන නීතියේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාමය පදනම ඇසුරින් ඉහත ප්‍රකාශය අගයන්න. ඉංග්‍රීසි සහ ශ්‍රී ලංකා අධිකරණ විසින් අදාළ කරගනු ලැබූ භූමිකාව විවේචනාත්මකව සාකච්ඡා කරන්න.

2. මහජන සෞඛ්‍ය විශේෂඥ කමිටුවේ උපදෙස් ලබා ගැනීමෙන් පසු බෝවන රෝග පාලනය කිරීම සඳහා රෙගුලාසි නිකුත් කිරීමට මහජන සෞඛ්‍ය පනත මගින් සෞඛ්‍ය අමාත්‍යවරයාට බලතල ලබා දී ඇත.
   වත්මන් පරිපාලන රෙගුලාසි, වෙනත් දේ අතර, සමාජ දුරස්ථභාවය පිළිබඳ රෙගුලාසි කඩ කරන තැනැත්තන්ව අත්අඩංගුවට ගැනීමට පොලිස් නිලධාරීන්ට ඉඩ ලබා දේ. කොවිඩ් ආසාදිත බවට සැක කෙරෙන පුද්ගලයන් සම්බන්ධයෙන් ඉක්මන් ප්‍රතිදේහජනක පරීක්ෂණ (RAT) පැවැත්වීමට මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන්ට (PHIs) රෙගුලාසි මගින් බලය ලබා දී ඇත. වඩාත් සුදුසු වැඩ පරිසරයක් ඉල්ලා දීප ව්‍යාප්ත විරෝධතාවක් පැවැත්වීමට වෘත්තීය සමිති කිහිපයක් සැලසුම් කර තිබේ. මාධ්‍ය හමුවකදී අමාත්‍යවරයා ප්‍රකාශ කළේ 'කිසිදු විරෝධතාකරුවෙකුට මේ රජය අපහසුතාවට පත් කිරීමට ඉඩ නොතබන' බවයි. එදිනම අමාත්‍යවරයා නව නියෝග කෙටුම්පත් කරන ලෙස වසංගත රෝග විද්‍යා දෙපාර්තමේන්තුවේ (DDoE) අධ්‍යක්ෂවරයාට නියෝග කළේය. 10 දෙනෙකුට වැඩි සහභාගිවන්නන් සහභාගී වන සියලුම ආකාරයේ මහජන විරෝධතා අමාත්‍යවරයා විසින් තහනම් කර ඇති බව දන්වමින් DDoE විසින් පොලිස්පති (IGP) වෙත ලිපියක් නිකුත් කරන ලදී. මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන්ගේ වෘත්තීය සමිතිය විරෝධතාවයේ නිරත වූ ඇඟලුම් සේවකයින්ට RAT පැවැත්වීම ප්‍රතික්ෂේප කර ඇති හෙයින්, පොලිස්පතිවරයා RAT කට්ටල ලබාගෙන ඒවා භාවිතා කිරීමට තම නිලධාරීන් පුහුණු කර ඇත. විරෝධතාකරුවන් 200 කට පමණ නවාතැන්

සැපයීමට සූදානම් වන ලෙස පොලිස්පතිවරයා නිරෝධායන මධ්‍යස්ථාන වෙත ලිඛිතව ද දන්වා ඇත.

පරිපාලන අධිකරණ බලය සහ අධිකාරීන් විසින් අභිමතය ක්‍රියාත්මක කිරීම සම්බන්ධ මූලධර්ම සහ නඩු තීන්දු කෙරෙහි අවධානය යොමු කරමින් මෙම තත්ත්වය විශ්ලේෂණය කරන්න.

3. "පරිපාලන ක්‍රියා විමර්ශනය සඳහා වන පරීක්ෂණය ලෙස සමානුපාතිකභාවය වෙනුවට (Proportionality)වෙන්ඩ්ස්බරි සාධාරණත්වය (Wednesbury reasonableness) ප්‍රතිස්ථාපනය කළ නොහැකි වීමට හේතුව ලෙස සමානුපාතිකභාවය පරීක්ෂණයේ වැඩි තීව්‍රතාවය විනිශ්චයකාරවරුන් සහ විද්වතුන් විසින් සලකනු ලැබේ. අධිකරණයේ වැඩි සැලකිලිමත්භාවයක් (judicial deference)අවශ්‍ය වන නඩු සඳහා වෙන්ඩ්ස්බරි පරීක්ෂණය පැවතිය යුතු බවට පවා යෝජනා කර ඇති අතර, සමානුපාතිකභාවය වඩාත් නිශ්චිත විමර්ශනයක් අවශ්‍ය වන අවස්ථා වලදී භාවිතා කරන ප්‍රමිතිය විය යුතුය."

ඉහත ප්‍රකාශයට එරෙහිව, සංකල්ප දෙකෙහිම තාර්කික පදනම විවේචනාත්මකව සාකච්ඡා කරන්න. නඩු තීන්දු ඇසුරින් එක්සත් රාජධානියේ සහ ශ්‍රී ලංකාවේ සිදුවී ඇති වර්ධනයන් සංසන්දනය කරන්න.

4. ලින්ඩා සතුව, තුවක්කු බලපත්‍ර පනත යටතේ වාර්ෂික අලුත් කිරීමට යටත්ව රිවෝල්වරයක් සඳහා බලපත්‍රයක් ඇත. තමා සමඟ ඇති කරගත් ආරවුලක් හේතුවෙන් තමාගේ කුලී නිවැසියා වන ලින්ඩා රිවෝල්වරයකින් තමාව මරණ බවට තර්ජනය කළ බවට අනිල් මගින් 2021 මාර්තු 2 වන දින පොලිස් අධිකාරීවරයාට පැමිණිල්ලක් ලැබිණි. අනිල් චෝදනා කළේ ලින්ඩා තමන් කුලියට සිටින නිවසේ විදුලි බිල්පත්වලට තම නම ආදේශ කිරීමට උත්සාහ කරන බවයි. ඇගේ තුවක්කු බලපත්‍රය අලුත් කිරීමට හේතුව පෙන්වන්නැයි ඇයගෙන් ඉල්ලා සිටිමින්, ලින්ඩාට 2021 මාර්තු 5 වන දින පොලිස් අධිකාරීවරයාගෙන් නොතීසියක් ලැබුණි. ලින්ඩාට එරෙහි පරීක්ෂණය 2021 මාර්තු 7 වන දින පැවැත්විණි. එම පරීක්ෂණයේදී ලින්ඩාට ඇයට එරෙහිව ඉදිරිපත් කරන ලද ලේඛන පරීක්ෂා කිරීමේ අවස්ථාව ප්‍රතික්ෂේප කරන ලදී. ඇයගේ වාචික ඉදිරිපත් කිරීම සඳහා ඇයට ලබා දුන්නේ විනාඩි පහක් පමණි. මතභේදයට තුඩු දී ඇති එම නිවසේ විදුලි බිල්පත්වල නම වෙනස් කිරීමට තමාගෙන් ඉල්ලීම් නොමැති බව තහවුරු කරන ලෙස තමන් විදුලිබල මණ්ඩලයෙන් ඉල්ලා සිටි බව ඇය පරීක්ෂණ මණ්ඩලයට පැහැදිලි කළාය. කෙසේ වෙතත්, විදුලි බල මණ්ඩලයේ ප්‍රමාදයක් සිදුවූ බැවින් ඇයගේ නඩුව ඔප්පු කිරීමට ඇයට තවත් කල් අවශ්‍ය විය. රිවෝල්වරයක් පෙන්වා අනිල්ට මරණීය තර්ජන කළ බවට වූ අසත්‍ය චෝදනාව සනාථ කිරීම සඳහා තම නේවාසික මිතුරිය ඇසින් දුටු සාක්ෂිකාරියක් ලෙස ඉදිරිපත් කරන ලෙස ලින්ඩා කළ ඉල්ලීම විමර්ශන මණ්ඩලය විසින් ප්‍රතික්ෂේප කරන ලදී. කමිටුවේ සොයාගැනීම් මත පදනම්ව, පොලිස් අධිකාරීවරයා 2021 මාර්තු 12 දින ඇයගේ බලපත්‍රය අවලංගු කරන ලදී. අධිකාරීවරයාගේ තීරණයට හේතු දැනගැනීමට ලින්ඩා දැරූ උත්සාහය අසාර්ථක විය. පසුව, ලින්ඩා තුවක්කු බලපත්‍ර සඳහා වන අභියාචනා මණ්ඩලයට අභියාචනයක් ඉදිරිපත් කළේය. තුවක්කු බලපත්‍ර පිළිබඳ අභියාචනා මණ්ඩලයේ තීරණය අවසාන සහ තීරණාත්මක බව පනත මගින් සඳහන් කරයි. ඇයගේ අභියාචනය විභාග කරන අවස්ථාවේදී, කලින් විමර්ශන මණ්ඩලයේදී තමාට එරෙහිව අදහස් දැක්වූ විමර්ශන මණ්ඩල සාමාජිකයෙකු වන රේමන්ඩ්, තුවක්කු බලපත්‍ර සඳහා වන අභියාචනා මණ්ඩලයේ වාඩි වී සිටින බව ලින්ඩා දුටුවාය.

මෙම අධිකාරීන්ගේ ක්‍රියාවන් අභියෝගයට ලක් කිරීමට ලින්ඩා අපේක්ෂා කරයි. ලින්ඩාට උපදෙස් දෙන්න.

5. 2020 සැප්තැම්බර් 20 වන දින, කාංචනා සංචාරක නිකේතනයක් ඉදිකිරීමේ අපේක්ෂාවෙන් පර්ල් ජාතික වනෝද්‍යානය (PNP) අසල පිහිටි වලිවත්ත මිලදී ගත්තේය. ඉඩම මිලදී ගැනීමට පෙර, ඇය ප්‍රාදේශීය නගර සභාව (TC) වෙත ගොස් ඇති අතර, එමගින් ඇයට දන්වා ඇත්තේ, නාගරික සංවර්ධන අධිකාරිය (UDA) විසින් සියලුම සංවර්ධන සැලසුම් අනුමත කළ යුතු බැවින්, ඔවුන්ට සංවර්ධන සීමාවන් නොමැති බවයි. කාංචනාගේ විමසීම්වලට පිළිතුරු දෙමින්, UDA විසින් කාංචනා වෙත ලිඛිතව ලියා ඇත්තේ ප්‍රදේශයේ සියලුම සංවර්ධන කටයුතු '2007 PNP සංරක්ෂණ මාර්ගෝපදේශ' හි අවශ්‍යතා සපුරාලිය යුතු බවත් නව ගොඩනැගිලි ඉදිකිරීම සඳහා සංවර්ධකයින්ට UDA අනුමැතිය ලබා ගැනීමට අවශ්‍ය කිරීම හැර, කිසිදු සංවර්ධන සීමාවක් ප්‍රකාශිතව පනවා නොමැති බවයි. 2021 මාර්තු 28 වන දින කාංචනා UDA වෙත ඇයගේ සංවර්ධන අයදුම්පත ඉදිරිපත් කළ නමුත් 2021 අප්‍රේල් 11 වන දින, UDA විසින් කිසිදු විස්තරයක් ලබා නොදී '2021 PNP සංරක්ෂණ මාර්ගෝපදේශ' උපුටා දක්වමින් ඇයගේ අයදුම්පත ප්‍රතික්ෂේප කරන ලදී. 2021 මැයි 30 වන දින, PNP ප්‍රවේශ මාර්ගය පුළුල් කිරීම සඳහා ඇයගේ ඉඩමෙන් 20% කට ආසන්න ප්‍රමාණයක් TC විසින් අත්පත් කර ගන්නා බවට කාංචනාට ලිපියක් ලැබුණි. 2021 ජූනි 5 වන දින TC සභාපතිනිය TC විසින් ඉඩම් පවරා ගැනීමට එරෙහිව විරෝධතා දක්වන PNP ප්‍රදේශවාසීන් හමුවිය. PNP ප්‍රදේශයේ ජනතාවගේ අදහස් විමසීමකින් තොරව කිසිදු ක්‍රියාමාර්ගයක් නොගන්නා බවට සභාපතිනිය පොරොන්දු විය. 2021 ජූනි 30 වන දින, UDA සහ TC මගින් අධිකාරී බලය ලත් පුද්ගලික ඉදිකිරීම් සමාගමක් වන මෙගා, මාර්ගය පුළුල් කිරීම සඳහා ප්‍රදේශය මැනීම ආරම්භ කළේය.

ඔබ කාංචනාට උපදෙස් දෙන කණ්ඩායමේ නීතිඥයෙකු යැයි උපකල්පනය කර කාංචනා සඳහා ඇති ප්‍රතිකර්ම ගැන නඩු සංක්ෂිප්තයක් සකස් කරන්න. සංක්ෂිප්තය කෙටුම්පත් කිරීම සඳහා සෑම කණ්ඩායම් සාමාජිකයෙකුටම යම් ක්ෂේත්‍ර වෙන් කර ඇති අතර ඔබේ කාර්යය වන්නේ කාංචනාගේ අයිතිවාසිකම් සහ අපේක්ෂාවන් කෙරෙහි විශේෂයෙන් අවධානය යොමු කරමින් පරිපාලන ක්‍රියාමාර්ග විමර්ශනය කිරීමේ පදනම් සාකච්ඡා කිරීමයි.

6. රේ, යනු මෙගලයන් විල්වලින් වට වූ කයිරෝ ගම්මානයේ ගොවීන්ගේ සුබසාධනය සම්බන්ධයෙන් කටයුතු කරන සමාජ සේවකයෙකි. කයිරෝ හි බොහෝ පවුල් පුද්ගලික පරිභෝජනය සහ ඔවුන්ගේ ප්‍රධාන ජීවනෝපාය මාර්ගය වන කෘෂිකර්මාන්තය සඳහා ජල සැපයුම සඳහා මෙගලයන් විල් මත රඳා සිටිති.
සාම්ප්‍රදායික ප්‍රජාවන්ගේ යටිතල පහසුකම් සංවර්ධන පනත (IDTCA) යටතේ කර්මාන්ත අමාත්‍යවරයාට පාරිසරික බලපෑම් තක්සේරුවක් (EIA) නොමැතිව දේශීය ප්‍රජාවගේ ආර්ථික අවශ්‍යතා සම්බන්ධයෙන් වන කුඩා සංවර්ධන ව්‍යාපෘති අනුමත කිරීමට බලය ඇත. එවැනි ව්‍යාපෘති අනුමත කිරීමේදී ප්‍රාදේශීය ප්‍රජාවන්ගේ සම්ප්‍රදායික ජීවනෝපාය සහ භාවිතයන් පිළිබඳව සලකා බැලීමට අමාත්‍යවරයාට යුතුකමක් ඇති බව IDTCA වැඩිදුරටත් සඳහන් කරයි. අමාත්‍යවරයා විසින් කයිරෝ හි පිහිටි වගා නොකළ රජයේ ඉඩම් අක්කර 100ක් වෙන්කරමින් 'මෙගලයන් ලේක්ස් කාර්මික කලාපය' ව්‍යාපෘතිය අනුමත කර කර්මාන්ත පිහිටුවීම සඳහා යෝජනා කැඳවීමට තීරණය කර ඇත. මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම නිසා ඇතිවිය හැකි අහිතකර බලපෑම් පිළිබඳව අමාත්‍යවරයාට කයිරෝ හි ගොවීන්ගෙන් පැමිණිලි කිහිපයක් ලැබිණි. ගොවීන්ගේ ගැටළු විසඳීම සඳහා මාධ්‍ය හමුවක් පවත්වමින් අමාත්‍යවරයා ප්‍රකාශ කළේ රැකියා අවස්ථා, යටිතල පහසුකම් සංවර්ධනය ඇතුළු ප්‍රතිලාභ රැසක් ප්‍රාදේශීය ප්‍රජාවට පවතින බවයි. රේ ව්‍යාපෘතිය තක්සේරු කළ අතර, කර්මාන්ත, ඇත්ත වශයෙන්ම, වැව් වලින් සැලකිය යුතු ජල ප්‍රමාණයක් භාවිතා කරන බවත්, ඉඩම් ඉඩම් එළි පෙහෙළි කිරීම ප්‍රාදේශීය පාරිසරික සමතුලිතතාවයට බරපතල බලපෑමක් ඇති කරන බවත් සොයා ගත්තේය. එය මෙගලයන් ප්‍රජාවගේ සාම්ප්‍රදායික ජීවනෝපායට සහ භාවිතයන්ට අහිතකර ලෙස බලපානු ඇත. කුඩා

සංවර්ධන ව්‍යාපෘති නොවන ව්‍යාපෘති සඳහා පාරිසරික බලපෑම් තක්සේරු කිරීම් අවශ්‍ය කිරීම අමාත්‍යවරයාගේ යුතුකම බවටද IDTCA සඳහන් කරයි. මේ අනුව, රේ විශ්වාස කරන්නේ මෙගලයන් ව්‍යාපෘතිය පාරිසරික බලපෑම් තක්සේරුවට යටත් බවයි.

අමාත්‍යවරයාගේ තීරණ රිට් අයදුම්පතක් මගින් අභියෝගයට ලක් කිරීමට රේ බලාපොරොත්තු වෙයි. නෛතික ස්ථීතිය පිලිබඳ රීතීන්ද ඇතුලත් කරමින් රේ ට උපදෙස් දෙන්න.

***************************